අඹගමුව ප්‍රාදේශීය සභාව - **2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අඹගමුව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන සැලැසුම් පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ සැලසුම් පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සැලසුම් පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සැලසුම් පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මස්කෙළිය උප කාර්යාලයේ වාහනවලට ඉන්ධන ලබා ගැනීම සඳහා මස්කෙළිය සමුපකාර සමිතිය වෙත ගෙවා තිබුණු රු.125,000 ක අත්තිකාරම් මස්කෙළිය ප්‍රාදේශීය සභාවට පවරා නොදී සභාවේ පෙර ගෙවුම් සහ අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. මෙය ඉකුත් වර්ෂයේ වාර්තාවෙන්ද පෙන්වා දී තිබුණි. | අදාළ ගැටළුව නිරාකරණය කොට ඉවත් කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | කාර්යාල උපකරණ ගිණුමට බැර කර තිබූ රු.529,912 ක් ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමට හර කළ යුතු වුවත් එම වටිනාකම සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.529,912 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ජ'නල් සටහනක් යොදා වරද නිවැරදි කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට සහ පෙර වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | 2021 වර්ෂයේ දී විගණන ගාස්තු ණයහිමියන් යටතේ පෙන්වීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හා වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස්දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා අනුරූපී වාර්තා අනුව ශේෂය අතර රු. 529,912 ක වෙනසක් විය. | ජ'නල් සටහනක් යොදා වරද නිවැරදි කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයකට අදාළව එකතුව රු. 11,750,472ක් වූ ගිණුම් ශේෂයක් ශේෂ උපලේඛන නොතිබීම හේතුවෙන් විගණනයේදී සත්‍යතාක්ෂණය කළ නොහැකි විය | සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව ණයගැති/ ණයහිමි ශේෂයන් අතරින් බහුතරයක් නැවත ප්‍රතිපූර්ණය නොවීම් හා ව්‍යාජ ශේෂ පෙන්වීම මත මෙම තත්ත්වය ඇති වී ඇත. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු31,943,635 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,748,348 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.1,373,201 ක් වූ හිඟයෙන් වර්ෂය තුළ අය කර තිබුණේ රු.574,938 ක් විය. | තව දුරටත් හිඟව පවතින අගයන් අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | නොපමාව හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ආ)** | **කුලී** | | |
| | කුලී ආදායම් ලෙස රු.6,540,000 ක් ඇස්තමේන්තුගත කළද බිල්කළ ආදායම රු.3,047,450 ක් හෙවත් ඇස්තමේන්තුගත ආදායමින් සියයට 46 ක් පමණක් විය. රැස්කළ ආදායම රු.1,903,376 ක් විය. | පවතින කොරෝනා වසංගත තත්ත්වය හමුවේ 2020 ආදායම් රැස් කිරීම අඩාල වුව ද 2021 වර්ෂයේ හිඟ ආදායම් රැස් කිරීම සඳහා ජංගම සේවා පවත්වාගෙන යනු ලබයි. | නොපමාව හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **ii.** | 2020 ජනවාරි 01 දිනට කුලී හා ගාස්තු (ටෙන්ඩර්) වලින් රු.763,214 ක් අයවිය යුතුව පැවතියද එයින් අයවී තිබුණේ රු.15,000 ක් විය. | පවතින කොරෝනා වසංගත තත්වය හමුවේ 2020 ආදායම් රැස් කිරීම අඩාල වුව ද 2021 වර්ෂයේ හිඟ ආදායම් රැස් කිරීම සඳහා ජංගම සේවා පවත්වාගෙන යනු ලබයි. | නොපමාව හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1995 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා විවිධ පුද්ගලයන්ට සහ ආයතනවලට අවස්ථා 199 කදී ගෙවන ලද රු.3,470,980 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණු අතර 2021 ඔක්තෝබර් 31 දින වන තවදුරටත් රු.1,834,888 සහ අත්තිකාරම් 192 ක් පියවිය යුතුව පැවතුණි. | අත්තිකාරම් පියවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. | නොපමාව පියවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වර්ෂ 03 කට වඩා පැරණි වටිනාකම රු.26,009,720 ක් වූ ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | ණයගැතියන්ගෙන් මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | නොපමාව පියවීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 ව්‍යාපෘති කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා රු.78,043,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද කළවැඩ වටිනාකම රු.8,313,130 ක් පමණක් වූයෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 11 ක් පමණක් විය. 2020 දෙසැම්බර් 11 දින වනවිට වැඩ නිමවා තිබුණේ එක් ව්‍යාපෘතියක පමණක් වූ අතර සියයට 75 කට වැඩි භෞතික ප්‍රගතියක් ලබාගෙන තිබූ ව්‍යාපෘති 07 ක් පමණි. ව්‍යාපෘති 27 ක භෞතික ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමේ පැවති අතර සියයට 10 ට අඩු භෞතික ප්‍රගතියක් වූ කර්මාන්ත 10 ක් පැවතුණි. | පවතින වසංගත තත්වය හමුවේ නියමිත පරිදි රාජකාරී සිදු කිරීමේ නොහැකියාව මත සංවර්ධන යෝජනාවල බලාපොරොත්තු වූ ආකාරයෙන් සියලු වැඩ අවසන් කිරීමට නොහැකි වූ අතර 2021 වර්ෂය තුළ අවසන් කරමි. | වසර තුළ ලැබෙන ප්‍රතිපාදන මඟින් මහජනයාට උපරිම සේවයක් වන පරිදි කාර්ය නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |